සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/05/02/01 | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2017.06.09 |

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2017/09

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් වෙත,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති වල පවත්වාගෙන යන "දිවිනැගුම ශ්‍රම ශක්ති" තැන්පතු ගිණුම සංශෝධනය කිරිම හා සමෘද්ධි ප්‍රාදේශිය සංවිධානවල නිල ගිණුම අරම්භ කිරිම</u>**

**01. හැදින්වීම.**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සඳහා 2012.10.31 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 30 සදහා පහත සංශෝධනයන් සිදු කරන අතර, තවද සමෘද්ධි ප්‍රාදේශිය ප්‍රජාමූල සංවිධාන සඳහා නිල ගිණුම ප්‍රජාමූල බැංකු සමිතියේ පවත්වාගෙන යැමට අවශ්‍ය උපදෙස් මෙමඟින් ලබාදෙමි.

තවද "දිවිනැගුම ශ්‍රම ශක්ති" ඉතුරුම් තැන්පතු ගිණුම මින් ඉදිරියට "සමෘද්ධි ශ්‍රම ශක්ති" ඉතුරුම් ගිණුම ලෙස සංශෝධනය කර පවත්වාගෙන යායුතුය.

02. දැනට නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් 30ට අනුව දිවිනැගුම ඉසුර ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කිරිමේ දි, ණය ඉල්ලුම් කරුවන්ට අමතරව සමෘද්ධි ප්‍රාදේශිය ප්‍රජාමූල සංවිධාන සඳහා ද බද්ධ ගිණුමක් ලෙස සමෘද්ධි ශ්‍රම ශක්ති ඉතිරි කිරිමේ ගිණුමක් පවත්වාගෙන යැමට අවසර දෙනු ලැබේ.

03. සමෘද්ධි ප්‍රාදේශිය ප්‍රජාමූල සංවිධාන සඳහා නව නිල ගිණුම ආරම්භ කිරිමේ දි මෙම චක්‍රලේඛනි ඇමුණුම 01 හි සඳහන් බද්ධ ගිණුමක් ආරම්භ කිරිමට හදුන්වා දෙන අයදුම් පත්‍රය භාවිතා කල යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**04. ආදර්ශ අත්සන හා ඉතුරුම් තැන්පතු පාස් පොත**

04.1. සමෘද්ධි ප්‍රාදේශිය ප්‍රජාමූල සංවිධානයේ සභාපති හා භාණ්ඩාගාරික නිල වශයෙන් ගිණුම ආරම්භ කිරිම හා මෙහෙය විමේ නිලධාරින් වේ.

04.2. මෙම බද්ධ ගිණුම සඳහා සමාජික නොවන තැන්පතු පාස් පොත සංශෝධන සහිතව තවදුරටත් භාවිතා කල යුතුය.

05. වාර්ෂික පොලී අනුපාත, පොලි ගණනය, ගිණුම් තැබිම ඇතුළු අනිකුත් උපදෙස් දැනටමත් දි ඇති උපදෙස් තව දුරටත් වලංගු කර ගත යුතුය.

06. 2017 වර්ෂය සඳහා, මෙම නිල ගිණුම ආරම්භ කිරිමට අවශ්‍ය කරන සහතිත කරන ලද ව්‍යවස්ථාව, රැස්විම් වාර්තාවේ පිටපත, ගිණුම මෙහෙය විමේ බලය ඇතුලත් ලේඛන නොමැතිව සිදුකල යුතුය.

07. දැනට මෙම "සමෘද්ධි ශ්‍රම ශක්ති" ඉතුරුම් ගිණුම බද්ධ ගිණුමක් ලෙස ආරම්භ කිරිමට අවසර ඇත්තේ සමෘද්ධි ප්‍රාදේශිය ප්‍රජාමූල සංවිධාන නිල ගිණුම ආරම්භ කිරිම සඳහා පමනක් වේ.

**නීල් බණ්ඩාර හපුහින්න,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත්

01. ලේකම් - සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - (කා.දැ.ස)
02. සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යත්ෂ ජනරාල්වරුන් - (කා.දැ.ස)
03. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - (දැ.ස හා අ.ක.ස)
04. සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් - (කා.දැ.ස)
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - (දැ.ස හා අ.ක.ස)
06. සියළුම මුලස්ථාන කළමණාකරුවන්, ප්‍රදේශිය ලේකම් කාර්යාලය - (අ.ක.ස)
07. සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් - (දැ.ස)